# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

**2013 අංක 01 දරණ සමෘද්ධි පනතහි 33(9) වගන්තිය**
**ප්‍රකාර සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩල අනුමැතිය යටතේ**
**නිකුත් කරනු ලබන විධානය :- 2018/04**

සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු /
බැංකු සමිති කළමණාකරුවන් වෙත

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති නිලධාරීන් සඳහා මාසිකව දීමනාවක් ගෙවීම .**

ඉහත කරුණ සම්බන්ධයෙන් අංක 2017/02 දරණ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් ඇමතූ ලිපිය හා බැඳේ.

02. 2018 වර්ෂයේ සිට, කාර්ය සාධනය පදනම් කර ගනිමින් මාසික දීමනාව ලබාදෙන බවට ඉහත චක්‍රලේඛනයේ සඳහන් කර ඇත. ඒ අනුව මාසික දීමනාව ලබාදීමට එක් එක් නිලධාරීන්ට කාර්ය සාධනය මැනීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වාදෙන තෙක් පහත සඳහන් නිර්නායකයන් පදනම් කරගෙන මාසික දීමනාව ලබාදීමට බැංකු කළමනාකරණ මණ්ඩලය අනුමත කර ඇත.

2.1. සමෘද්ධි ප්‍රජාමූල බැංකුව

| නිර්ණායකය | සකස් කළ යුතු/ ලබා දිය යුතු අවසාන දිනය |
|---|---|
| i. මාසික ප්‍රගති වාර්තාව (ණය/ තැන්පතු/ආයෝජන) | සෑම මසකම වාර්තාව, එළඹෙන මස 05 දිනට පෙර, |
| ii. කේවල ශේෂ පිරික්ෂුම් ලබා ගැනීම. (ණය/ තැන්පතු/ආයෝජන ගිණුම්) | සෑම මසකම ශේෂ පිරික්ෂුම, එළඹෙන මස 15 දිනට පෙර |
| iii. පොදු ලෙජරය සමඟ කේවල ශේෂ පිරික්සුම් තුලනය වීම. | සෑම මසකම තුලනය කිරීම, එළඹෙන මස 15 දිනට පෙර |
| iv. අභ්‍යන්තර/ රජයේ/ බාහිර විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම. | විමසුම ලැබී දින 14 ක් ඇතුළත. |

2.2. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය

| නිර්ණායකය | සකස් කළ යුතු/ ලබා දිය යුතු අවසාන දිනය |
|---|---|
| i. බැංකු / බැංකු සමිති මාසික ප්‍රගති වාර්තා ලබා දීම. (දිස්ත්‍රික් සමෘද්ධි අංශයට) | සෑම මසකම අදාළ වාර්තා, එළඹෙන මස 10 දිනට පෙර, |
| ii. ආයෝජන ශේෂ පිරික්ෂුම් ලබා ගැනීම හා පොදු ලෙජරය සමඟ තුලනය කිරීම/ණය හා සමූහ සංරක්ෂණ තත්ත්ව වාර්තා පිළියෙල කිරීම. | සෑම මසකම වාර්තාව, එළඹෙන මස 05 දිනට පෙර |
| iii. අභ්‍යන්තර/ රජයේ/ බාහිර විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම. | විමසුම ලැබී දින 14ක් තුළ පිළිතුරු සැපයීම. |
| iv. බැංකු අරමුදල් ආයෝජන කල් පිරී නිවේදන සමෘද්ධි බැංකුවට ලබා දීම. | කල් පිරුණු දින සිට වැඩකරන දින 05ක් තුළ , |

2.3. සමෘද්ධි බැංකු වල කේවල ශේෂ පිරික්ෂුම් (පොදු ලෙජරය සමඟ) තුලනය කිරීමේදී, 2017.12.31 දිනට, තුලනය නොවූ බැංකු විසින් සෑම මසකම අවසාන දිනට කේවල ශේෂ පිරික්ෂුම ලබා ගෙන තිබිය යුතුය. එමෙන්ම 2017.12.31 දිනට තුලනය නොවී වෙනසක් ඇති විටක, පවතින වෙනස නොවෙනස්ව හෝ වෙනස අඩු කර ගෙන ඉදිරියට එන බැංකු සඳහා ද මාසික දීමනාව ලබාගැනීමට ඉඩදෙනු ලැබේ. මෙම සහනය බැංකු සමිති සඳහා හිමි නොවේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர்
தலைமையதிபதி
Director General
Tel- 011-2871672/2872202
Fax - 011-2889002
E-mail- dg@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (මානව සම්පත්)
பணிப்பாளர்
( மனிதவளம்)
Director (Human Resource)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
**Hot Line :0112-889007**

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
பணிப்பாளர் (குறு நிதி )
Director ( Micro Finance)
011-2889003
011-2887469
**Hot Line:0112-885582**

කාර්යාලය
அலுவலகம்
Office
0112872202
**Hot Line: 011- 2887722**
**Desktop -shani**

2.4. සමෘද්ධි බැංකු/ බැංකු සමිති සඳහා මාසික දීමනාව ලබා ගැනීමට සපුරාගත යුතු නිර්ණායක නියමිත දිනට සම්පූර්ණ නොකරන විටක, අදාළ මාසයට හිමි දීමනාව ලබා ගැනීමට කිසිදු නිලධාරියෙකුට වරප්‍රසාද හිමි නොවේ.නමුත් විශේෂ හෝ ස්වාභාවික තත්ත්වයක් තුළ නියමිත දිනට පෙර අවසන් කිරීමට නොහැකි විටක, ඒ සඳහා විශේෂිත අනුමැතිය අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) මඟින් ලබාගත යුතුය.

03. මාසික දීමනාවට හිමිකම් ලබන නව නිලධාරීන් ඇතුළත් කිරීම.

3.1. පහත නිලධාරීන්ට අනුමත මාසික දීමනාව ලබාගැනීමට හඳුන්වා දී ඇති කාර්යයන් අනිවාර්යෙන් ඉටුකළ පසු ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. මෙම දීමනාව 2018.01.01 දින සිට වලංගු වේ.

| බැංකුව | තනතුර | මාසික දීමනාව (රු) |
|---|---|---|
| සමෘද්ධි ප්‍රජාමූල බැංකුව | කලාප සහකාර (ක්ෂේත්‍ර සහකාර) | 2000.00 |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | ව්‍යාපෘති කළමණාකරු | 2,500.00 |
| සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය | ව්‍යාපෘති සහකාර | 2,000.00 |

3.2. ඡේද අංක 3.1හි නම් කර ඇති නිලධාරීන් විසින් පවරා ඇති රාජකාරිවලට අමතරව, පහත රාජකාරිවල නිරත වූ විටක පමණක් මාසික දීමනාව ලැබීමට සුදුසුකම් ලබයි.

| තනතුර | ඉටුකළ යුතු කාර්යයන් |
|---|---|
| කලාප (ක්ෂේත්‍ර) සහකාර | I. සමෘද්ධි බැංකු ණය ව්‍යාපෘති පෙර/ පසු විපරම් කිරීම.<br>II. කල්පසු හා පැහැර හැරීම් ණය අය කර ගැනීමට කටයුතු කිරීම.<br>III. සමෘද්ධි බැංකු කලාප හා මාසික ප්‍රගති රැස්වීම් සංවිධානය කිරීම, තොරතුරු පිළියෙළ කිරීම.<br>IV. සමෘද්ධි බැංකු පරිශ්‍රය ක්‍රමවත්ව තබා ගැනීමට සහාය වීම.<br>V. රාජකාරි ලැයිස්තුවේ බැංකු විෂයට අදාළ අනෙකුත් කාර්යයන් ඉටු කිරීම. |
| ව්‍යාපෘති කළමණාකරු | I. සමෘද්ධි බැංකු/ බැංකු සමිති ණය ඉල්ලීම් වලට අදාළ ව්‍යාපෘති වාර්තා සකස් කිරීමට සහාය වීම, ඇගයීම් කිරීම, නිර්දේශ ලබා දීම.<br>II. සමෘද්ධි ඉසුරු ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති ණය පෙර /පසු විපරම් කිරීම.<br>III. ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන යටතේ ණය මුදාහැරීමට සහාය වීම.<br>IV. පවුල් සවිබල ගැන්වීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සහාය වීම. |
| ව්‍යාපෘති සහකාර | I. සමෘද්ධි බැංකු/ බැංකු සමිති ණය ඉල්ලීම් වලට අදාළ ව්‍යාපෘති වාර්තා සකස් කිරීම හා ඇගයීම් කිරීමට සහාය ලබා දීම.<br>II. සමෘද්ධි ඉසුරු ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති ණය පෙර /පසු විපරම් කිරීම.<br>III. ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන යටතේ ණය මුදාහැරීමට සහාය වීම.<br>IV. පවුල් සවිබල ගැන්වීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සහාය වීම. |

3.3 ඡේද අංක 3.1 හි සඳහන් නිලධාරීන්ට මාසික දීමනාව ගෙවීමේ දී, 3.2 හි සඳහන් රාජකාරී ඉටුකර ඇති බවට බැංකු/ බැංකු සමිති කළමනාකරු විසින් තහවුරු කරගත් පසුව පමණක් දීමනාව ගෙවීමට කටයුතු කළ යුතුය. නමුත් ඉහත ඡේද අංක 02 හි සඳහන් නිර්නායකයන් සම්පූර්ණ කිරීමට නොහැකි වූ අවස්ථාවක බැංකු/ බැංකු සමිති නිලධාරීන්ට දීමනා ලැබීමට හිමිකම් නොලබන බැවින්, ඉහත 3.1 හි සඳහන් නිලධාරීන්ට ද මාසික දීමනාව ලබාගැනීමට හැකියාව නැත.

04. මාසික දීමනාව ලබා ගැනීම පිළිබඳ, සොයා බැලීම හා වාර්තා කිරීම දිස්ත්‍රික් විගණන/ අධීක්ෂණ අංශයට පැවරෙන අතර, මෙම විධි විධාන වලට පටහැනිව කටයුතු කර ඇති සමෘද්ධි බැංකු/ බැංකු සමිති සම්බන්ධව කටයුතු කිරීමට දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත බලය පැවරේ.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩලයේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්,**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.**